Impact of Buddhism to animallore of Sri Lanka

# ශ්‍රී ලාංකේය සත්ත්වශ්‍රැතිය කෙරෙහි බුදුදහමේ බලපෑම

**ආචාර්ය ජයන්ත ජයසිරි**
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

## හැඳින්වීම

සත්ත්වශ්‍රැතිය (Animal lore) ජනශ්‍රැතියෙහි (Folklore) උපාංගයකි - සතුන් ප්‍රධාන චරිතය බවට පත්කරගත් සත්ත්වකථා (Animal tale) ලෝකයේ සෑම ආකාරයකම සංස්කෘතීන් වලින් සොයාගත හැකිය. (Leach 1947) ඒ බොහොමයක් සත්ත්වශ්‍රැති ඒ ඒ රටවලට ආවේණිකව ගොඩනැගී ඇත. ශ්‍රී ලංකාවට ආවේණිකව ගොඩනැගුණු සත්ත්වශ්‍රැති විශාල ප්‍රමාණයක් ද හඳුනාගත හැකිය. ඒවාද විවිධ ප්‍රස්තුත ඔස්සේ වර්ගීකරණය කළ හැකිය. නිදසුන් ලෙස සුභ, අසුභ, වාසනාවන්ත, අවාසනාවන්ත, අත්භූත,

මිත්‍යාකල්පිත ආදී වශයෙනි. මේවා පිළිබඳව ලෝකයේ විවිධ සමාජ අධ්‍යයනය කරමින් මානව විද්‍යාඥයන් විසින් කරුණු අනාවරණයකොට ඇත. බොහෝ ජනකථා තුළ සත්ත්වශ්‍රැති ද රාශියක් හමුවේ. එසේ නැතිනම් ජනකථාවක කොටසකට හෝ සත්ත්වශ්‍රැති එකතු වේ. හෙන්රි පාකර් (Henry Parker) විසින් වෙළුම් කීපයක් ඔස්සේ ඒකරාශි කරන ලද සිංහල ජනකථා තුළ සත්ත්ව චරිත ද අපට හමුවේ. (Parker) උක්ත මාතෘකාව සම්බන්ධයෙන් කරුණු ඒකරාශිකොට ලියන ලද ග්‍රන්ථයක් හෝ විද්‍යාත්මකව ලියන ලද ලිපියක් අපට හමුනොවේ. මේ පිළිබඳව මහාචාර්ය නන්දසේන රත්නපාල විසින් ලියන ලද 'ජනශ්‍රැති විද්‍යාව' සහ ' Sinhalese Folklore ' යන ග්‍රන්ථ දෙකෙහි පරිච්ඡේද දෙකක දැක්වේ. එහි අනාදිමත් කාලයක සිට පැවැත එන, මුඛ පරම්පරාගතව පැවත එන අදටත් අප සමාජයේ පවතින අගනා සත්ත්වශ්‍රැති රාශියක් විවරණයකොට ඇත.

ශ්‍රී ලංකාවේ බහුලව දක්නට ඇති සත්ත්වශ්‍රැති දෙස බැලීමේ දී පෙනී යන වැදගත් කරුණක් වේ. එනම් ඇතැම් ඒවා හැරුණුවිට බොහෝමයක් සත්ත්වශ්‍රැතිවලට බුදු දහමේ ආභාසය ද ලැබී ඇති බවයි. මේ සඳහා 'පින පව සංකල්පය, කර්ම සංකල්පය මෙන්ම ජාතක පොතෙහි ඇතුළත් කථා ප්‍රවෘත්තිවල ප්‍රබල බලපෑමක් සිදුවන්නට ඇතැයි සිතිය හැකිය. ඒවා බොහෝවිට අදාළ සත්ත්වයින්ගේ ආරක්ෂාව පිණිස, සතාට ගෞරව කිරීම පිණිස මෙන්ම සත්ත්වයාගේ සමාජ වටිනාකම වැඩි කිරීම පිණිස හේතු භූත වී ඇත. නිදහසුන් ලෙස ඇතා, සිංහයා, මොනරා, නයා ආදී සතුන් පෙන්වා දිය හැකිය. බෝධිසත්ත්ව ආත්මභාව නොලැබූ සතුන් 'නීච සතුන්' (පහත් ලෙස සලකා තිබෙන බව පෙනේ. නිදසුන් ලෙස ගැරඬියා, කපුටා, බල්ලා, කබරයා ආදි සතුන් පෙන්වා දිය හැකිය. නමුත් ඔවුන්ට සැලකීම ද වැදගත් දෙයක් ලෙසටම හුවා දක්වා තිබේ. ඊට එක් හේතුවක් විය හැක්කේ බුදුන්වහන්සේ දේශනා කරන ලද දක්ඛිණ විභංග සූත්‍රයේ දැක්වෙන දාන වර්ග දාහතරින් එකක් තිරිසන් සතුන් වෙනුවෙන් විය හැකි නිසාය. බලුකපුටු දානයට, කුක්කා දානය (විමලකිත්ති හිමි, 2002) ආදියට ආගමික වටිනාකමක් දී ඇතිවාක් මෙන්ම 'ගැරඬි කෑවොත් බෙහෙත් නැහැ, 'ගොම පෑගුනොත් බෙහෙත් අහන්නේ නැහැ, 'ගැරඬි මරලා පව්ගන්න



එපා', බල්ලෝ මරලා සල්ලි හම්බකරන්නේ නැහැ' ආදිය පෙන්වා දිය හැකිය. මෙ අනුව ශ්‍රී ලාංකේය ජන සමාජය තුළ සත්ත්වශ්‍රැති හා බෞද්ධ සංස්කෘතික සමාජ වටපිටාව අවබෝධකර ගැනීමක් මෙ තුළින් සත්ත්ව ලෝකයට, තිරිසන්ගත සමාජයට සිදුවී ඇති සාධාරණය කෙබඳු ද යන්නත්, එය වත්මන් සමාජයට කෙතරම් ගැළපේ ද යන්නත් සොයා බැලීම අතිශයින් වැදගත් වූ කාරණාවකි.

## අධ්‍යයනයෙහි අරමුණු

ජනශ්‍රැති විද්‍යාව සංස්කෘතික මානව විද්‍යාවේ (Cultural Anthropology) උපවිෂය ක්ෂේත්‍රයකි. ජනශ්‍රැති විද්‍යාවට (Science of folklore) අනුව සත්ත්වශ්‍රැතියට හිමිවන්නේ ඉතා වැදගත් තැනකි. මානව විද්‍යාත්මක දෘෂ්ටි කෝණයෙන් සකස් කරන ලද මෙම පර්යේෂණාත්මක ලිපියෙහි මුඛ්‍ය පරමාර්ථය වන්නේ, ශ්‍රී ලාංකේය ජනසමාජය තුළ විවිධ පසුබිම් ඔස්සේ ගොඩනැගී ඇති සත්ත්වශ්‍රැති කෙරෙහි බුදු දහම කවරාකාර බලපෑමක් සිදුකර තිබේ ද යන්න සොයා බැලීමයි. ඊට අමතරව සුවිශේෂ අරමුණු ලෙස සත්ත්ව කොට්ඨාස වර්ගීකරණයකට ලක්කොට ඒ ඒ අංග සුවිශේෂිව අධ්‍යයනය කිරීම, පුද්ගල ජීවිතයේ වැදගත් අවස්ථාවල දී සත්ත්වශ්‍රැතිය ප්‍රයෝජනයට ගෙන ඇති ආකාරය පිළිබඳව අවබෝධය ලැබීම හා පුද්ගල සමාජානුයෝජනයට හා පෞරුෂ සංවර්ධනයට සත්ත්වශ්‍රැති බලපාන්නේ කෙසේද යන්න ආදිය සොයා බැලීම ආදිය මෙහිලා පෙන්වා දිය හැකිය.

## මූලාශ්‍ර හා ක්‍රමවේදය

මෙම ලිපිය සම්පාදනය කිරීම සඳහා ප්‍රාථමික සහ ද්විතියික මූලාශ්‍ර (Primary and Secondary Sources) භාවිතයට ගන්නා ලදි. ලිඛිත මූලාශ්‍ර වශයෙන් මේ සඳහා ලියවී ඇති ඓතිහාසික මූලාශ්‍ර පොත්පත්, ලිපිලේඛන ආදි ප්‍රයෝජනයට ගන්නා ලදී. ශ්‍රී ලාංකේය ජන සමාජය තුළ විසිරී පවත්නා විවිධ සත්ත්වශ්‍රැතීන් ලැබෙන සෑම අවස්ථාවකින්ම ප්‍රයෝජනට ගනිමින් ඒකරාශි කරගන්නා ලද අතර ඒ සියල්ල ප්‍රාථමික මූලාශ්‍ර ලෙස යොදා ගන්නා ලදී. මෙහි දී ශ්‍රී

ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ජනශ්‍රැති විද්‍යාව හදාරන මානව විද්‍යා විශේෂ උපාධි සිසුන් විසින් ලබා දෙන ලද දත්ත (Data) රාශියක්ද අඩංගු වේ. මෙම කර්තව්‍යයේ දී දත්ත ඒකරාශී කිරීම සඳහා යොදාගන්නා ලද මූලිකව පර්යේෂණ ක්‍රමවේදය වූයේ සම්මුඛ සාකච්ඡාව (Interview method) සහ නිරීක්ෂණයයි (Observation method) ඒ අනුව මෙම පර්යේෂණාත්මක ලිපිය මානව විද්‍යාත්මක පර්යේෂණ ක්‍රමවේදයන් භාවිතයෙන් ඒකරාශී කරගන්නා ලද ලිඛිත මූලාශ්‍ර මෙන්ම ගුණාත්මක වශයෙන් ඒකරාශීකර ගන්නා ලද දත්ත විශ්ලේෂණය කිරීමකි.

## විවිධ සතුන් පිළිබඳ ජනශ්‍රැති

සත්ත්ව ලෝකය විවිධ එළඹුම් ඔස්සේ වර්ගීකරණයකොට ඇත. එය සතුන්, පක්ෂීන් හා ජලජ ජීවීන් වශයෙනි. ඒ අතර ගොඩ - මඩ දෙකෙහිම වාසය කළ හැකි. සතුන් ද (උභයජීවීන්) හමුවේ. සත්ත්ව ලෝකය පිළිබඳ ඉතාම පැහැදිලි වර්ගීකරණයක් කඳ පිරිත (ඛන්ධපරිත්ත) තුළ දැක්වේ. (චන්දිම හිමි, 2000) කඳ පිරිතට අනුව සියලුම සත්ත්ව ලෝකය කොටස් හතරකි. එනම් දෙපානැති (අපාදකො) පා දෙකක් ඇති (දිපාදකො) පා සතරක් ඇති (චතුප්පදො) සහ බොහෝපා ඇති (බහුප්පදො) යනාදී වශයෙනි. මෙම සියලු සතුන් ආවරණය වන පරිදි ගොඩනැගී ඇති සත්ත්ව ශ්‍රැති හමුවේ. සතුන් සම්බන්ධව සලකා බැලීමේ දී ලොකු කුඩා සෑම සතෙක්ම ඊට අයත් වන බව පෙනේ. කුඩාම සතා ලෙස සැලකෙන කුඹියා ගත් කළ කුඹින් වර්ග රාශියකි. කළුකුඹි, තෙල් කුඹි, නයි කුඹි හා කොඩයින් ආදියයි. (කළු කුඹි විශේෂයක් මෙම කුහුඹුවන් විශේෂයෙන් ගස්වල කූඩු සාදාගෙන ජීවත් වේ.) (ලියනගේ, 2001) මෙම කුහුඹුවන් අතර වාසනාවන්තම සතා කළුකුහුඹුවාය. උන් නිවෙස්වලට රංචු වශයෙන් පැමිණීම වාසනාවකි. කළු කුහුඹුවන් බිත්තර ද සහිතව පැමිණෙන්නේ නම් නුදුරු අනාගතයේදීම යම් වාසියක් අත්වන බව විශ්වාසයේ පවතී. අනෙකුත් කුහුඹුවන් කෙරෙහි විශේෂත්වයක් නොමැත. නිවසෙහි කුමන හෝ ස්ථානයක තුඹස් බැඳීම ඉතා අවාසනාවන්ත කාලයක පෙර නිමිත්තක් සේ සැලකේ. ගෙදර දොර අයවලුන්ගේ, විශේෂයෙන් ගෘහමූලිකයාගේ ඇඳුම් පැළඳුම් මීයන් විකා දැමීම ද



අනාගතයේ ලෙඩදුක් කරදර ඇති විය හැකිබව පෙන්නුම් කිරීමක් සේ පිළිගැනේ.

නිවස ඉදිරිපිටට හෝ ගෙවත්තට නිවසට ඇතැම් සතුන්ගේ පැමිණීම අසුභ යයි සැලකේ. ඒ අතර කබරගොයා, වැදගත්ය. කබරතෙල් උග්‍ර විෂ සහිත තෙල් වර්ගයක් සේ සැලකේ. (කබරගොයින් ආ දොසේ හෙට පලයං ඒ දෝසේ) ගෙරියන් (නිමිතිකාරක කෘමි විශේෂයකි. ස්වරූපයෙන් වෙයාට සමාන පැහැයෙන් කළුපාට සත්ත්වයෙකි. ඉදිකඩ හරහා මොවුන් ගමන් කිරීම අශුභය. ලෙඩ රෝග ඇතිවන බවට පෙර නිමිත්තකැයි සැලකේ) (ලියනගේ 2001) (ගෙට ගෙරියන් ආ දෝසේ හෙට පලයං ඒ දෝසේ) හූනා කුඩා වුවත් ජනශ්‍රැතියට ඉතා වැදගත් සතෙකි. හූනු ශාස්ත්‍රය පිළිබඳ විවිධ ජනප්‍රවාද පවතී. නිමිති ශාස්ත්‍රය තුළ හූනාට ලැබෙන්නේ විශේෂ පිළිගැනීමකි. හූනා හැඬීම, ඇඟට වැටීම, මළ පහකිරීම ආදිය සම්බන්ධයෙන් 'පෙරනිමිති කීම් මහත් රාශියක් වේ. හූනා හඬන දිසාවත් හඬන දිනයක් අනුව එකී ප්‍රතිඵල එකිනෙකින් වෙනස්වෙයි. ඒ අනුව අනාවැකි සහ අනාවැකි අරුත්ද විවිධාර්ථ ගනියි. හූනන්ගේ ඇඟවැටීම ගැන කියවෙන නිමිති රාශියක් ද ව්‍යවහාරයේ පවතී. වැටුණු ස්ථානය අනුව ප්‍රතිඵලය වෙනස් වේ. නිදසුන් ලෙස හිස - කෝලාහලවලට පැටලේ නළල, යස ඉසුරු ලැබේ. දකුණු ඇලය - විපත් පැමිණෙයි. පිට මහත් ලාභ ඇතිවේ. යනාදි වශයෙනි.

කිඹුලා හා හූනා නෑයන් සේ සැලකේ. කිඹුලා ගඟේදී මිනිසෙක් සපා කෑ විට, මිනිසා උගෙන් බේරුනොත් කිඹුලා කියන්නේ 'මගෙන් බේරිලා ගෙදර ගියත් උඹ මගෙ මල්ලිගෙන් බේරෙන්නෙ නෑ'යි කියයි. හූනා එවන් අයකුගේ ඇඟට මුත්‍රා කළහොත්. කිඹුලා කළා වූ තුවාළය සුව නොවී ඒ තැනැත්තා නිසැකයෙන්ම මරණයට පත්වන බව විශ්වාස කෙරේ. (රත්නපාල, 1995) නිවසකට ගැරඬින්ගේ පැමිණීම ද අසුභය. නිවස තුළට වසුරු හෙළීම හෝ මුත්‍රා කිරීම ඊටත් වඩා අසුභයකි. ගැරඬින්ගේ නයින්ගේ අභිරමණය දැක්ම ද අසුභ දර්ශනයකි. (බොහෝ උරග ගණයේ සතුන් කෙරේ. මෙම විශ්වාසය පවතී.) කළු කුරුමිණියා හෙවත් අම්බලන් පාලුවා ගෙයකට පැමිණෙන්නේ නම් එම නිවස පාළුවට යන බවට මතයක්

පවතී. (කුරුම්භයන් ආ දෝසෙ නෙව පලයං ඒ දෝසේ) එසේම බකිරි, දෙබිර වැනි සතුන් නිවසේ වද බදියි නම් එයද අවාසනාවේ පෙර නිමිත්තකි. එකී ගෙනිමිනට එය ඉතාමත් අසුභ ඵල ගෙනදෙන්නක් සේ සැලකේ. නමුදු ගෙයි මුදුන් යට ලීයේ හෝ මුදුන් බිත්තියේ මියක් බදින්නේ නම් එය ඉතාමත් සුභ ඵල දෙන සිද්ධියකි. එය වාසනාවන්ත කාලයක පෙර නිමිත්තක් වන අතර, හදිසි ධන ලාභ ලැබීමට හේතුවක් වන බවටත් විශ්වාස කෙරේ. නිවසක රත්කුඹිලන් විසින් ගෙවල් සෑදීම සුභ දෙයකි. එය වාසනාවන්ත දෙයක් ලෙසිනි. අනාගතයේ දී නිවැසි කාන්තාවක ගර්භනීවීමේ පූර්ව ලකුණකි.

නිවස අසල බල්ලන් උඩුබුරලීම හා කන්පොට ගැසීම ද අසුභ දෙයක් ලෙස ගැමියෝ විශ්වාස කරති. බැල්ලියක් හෝ බැළලියක් නැතිනම් පවුලේ වැස්සියක් පැටවුන් වදනවා දැකීම ගැබිණියන්ට අපල ගෙන දෙන්නක් සේ සැලකේ. රාත්‍රී කාලයේ දී නරි කෑගැසීම අතිශයින්ම අසුභදායක දෙයකි. දින හතක් ඇතුළත දී අදාළ ප්‍රදේශය තුළ මරණයක් සිදුවන බව පිළිගැනේ. බළලෙක් රථයකට හසුවීම ද ඉතා අසුභ පෙර නිමිත්තක් සේ සලකණු ලබන අතර, එම රථය නොබෝදිනකින්ම අනතුරකට ලක්වේ යයි විශ්වාසයේ පවතී. රාත්‍රී කාලයේ බළලුන් පොරකෑම ද අසුභ පෙර නිමිත්තක් සේ සලකනු ලැබේ.

කවුස්සා පිළිබඳ විවිධ ජනශ්‍රැති පවතී. බෝදිරිමා (බෝදිලිමා) යනුවෙන් කවුස්සාට වඩා විශාල සතෙක් ද වේ. ඌ අවශ්‍ය වූ විටෙක පරිසරයට අනුවර්ථනය වීම පිණිස ස්වකීය වර්ණය වෙනස් කළ හැකිය. ඒ නිසා ඌ යක්ෂ අවතාරයක් ලෙස ද සැලකේ. බෝදිලිමා ගැබිනියන් කෙරෙහි බරපතළ වෛරයකින් පසුවේ. දරුප්‍රසූතියේ දී මිය යන කාන්තාවන් 'බෝදිලිමා' නම් යක්ෂණියකගේ වෛරයෙන් උපදින බවට ප්‍රබල ගැමි විශ්වාසයක් පවතී. බෝදිලිමා හඬනා හඬ ඇසෙන විට. කාන්තාවක් පොල් තෙල් පහණක් දල්වා ඒ අසලින් බුලත් කොළ කිපයක් ද තබති. බෝදිලිමා පැමිණ බුලත් කොළයේ තෙල් තවරා පොල් තෙල් පහනේ ගිනි දැල්ලට අල්ලා රත්මාකාට තමන්ගේ උදරය තවා ගනිමින් වේදනාව මඟහැර ගැනීමට ප්‍රතිකාර කරගන්නා බව කියති. තම වේදනාව පහකර ගැනීමට



අවස්ථාව සැලසීම මහත් පුණ්‍යකර්මයක් බව විශ්වාසයේ පවතී. ඇතැම් අය අඳුරට වෙඩි තැබීමෙන් පසුව පහුවදාට මියගිය කවුස්සෙකු හමුවෙන බවද ජනප්‍රවාදයේ පවතී. ඇතැම් ප්‍රදේශවල බෝදිලිමා හඳුන්වනනේ 'සොබනී' යන අන්වර්ත නාමයෙනි. (පීරිස්, 2007)

උරගුන් අතර සත්ත්වශ්‍රැති බහුතරයක් ඇත්තේ නයා මුල්කොට ගෙනය. සිංහලයන් අතර 'නාග ' ශ්‍රෝතිකයන්ට වැදගත් තැනක් හිමි වේ. නාගයා ඔවුන්ගේ සංකේතය විය හැකිය. බුදුන් වහන්සේගේ දෙවැනි ලංකාගමනය නාග ශ්‍රෝතිකයන් හා සම්බන්ධ වේ. කැළණියේ මෙන්ම නාගදීපයේ ද මෙම ශ්‍රෝතිකයන් ජීවත්ව ඇත. නාගවිහාරය වැදගත් පූජනීය ස්ථානයකි. මණිඅක්ඛිත, චූලෝදර, මහෝදර එබඳු නාග රජවරුවන්ය. නාගයන්ගේ රූප ආරක්ෂා රූප ලෙස සිද්ධාස්ථානවල කැටයම් කර ඇත. නයාට වරදක් නොකළොත් උගෙන් මනුෂ්‍යයාට වරදක් නැතැයි විශ්වාස කෙරේ. එබැවින් ඌට පහරදීම, මැරීම නොකළ යුත්තකි. නයාගේ ශාපය අතිශයින්ම භයානක එකක් බව ව්‍යවහාරයේ පවතී. ඇතැම් නාගයින්ට නාග මාණික්‍ය ඇතැයි පිළිගැනේ. එය ඌ පණමෙන් ආරක්ෂා කරයි. ඌ එය තම ගෙලෙන් ඉවත් කරන්නේ ආහාර ගන්නා විට පමණය. මෙම නාග මාණික්‍ය අයත් කර ගන්නට නම් ඒ නයා ගොදුර ගන්නා මොහොත එනතෙක් බලාසිටිය යුතුය. නයා මාණික්‍ය ඉවත තැබූ හැටියේ මැණික ගොමවලින් වැසිය යුතුය. ගොම නිසා පිළිකුලෙන් මැණික ගැනීමට නොයන නයා එය නැතිවීමේ දුකින් එතැනම පෙනය බිම ගසා මරණයට පත්වන්නේ යයි විශ්වාස කෙරේ. (රත්නපාල, 1995)

සන්ධ්‍යා භාගයේ නිවෙස් තුළ, ලඳුකැලෑ ආශ්‍රිත හෝ පිට්ටනිවල සිට බටනලා පිඹීම නොකළ යුතු යයි සැලකේ. නලා හඬට දපහාය වැටෙන නාගයින් නිවෙස් තුළට ඇඳී එතැයි ද, වාදනය නතර කළවිට උන් විසින් පහර දෙනු ලබතැයි ද විශ්වාසයේ පවතී. මිය ගිය ඥාතීන් නාගයින් වී උපදින්නේ යැයි ද ආදරය නිසා නිවෙස්වලට පැමිණෙන්නේ යැයි ද විශ්වාසයේ පවතී. ඉන්දියාවේ හිමාල වනයේ සිටින 'කොබෝ නයින්' නම් නාග විශේෂයක් ගැන ද ජනප්‍රවාදයෙහි කියැවේ. මෙම නයින් ක්‍රමයෙන් මානලු බවට පත්වන විට උන්ගේ

පුරුක් එකින් එක හැලියන බවත් අවසානයේ දි එක් පුරුකක් ඉතිරිවී එයින් පිහාටු මැවී ඉගිල යන බවත්, එම අවස්ථාව 'කොබෝ නගා' ලෙස හඳුන්වන බවත් ජනශ්‍රැතියෙහි දැක්වේ. ඉන්දියාවේ ශ්‍රී විෂ්ණුපාමි 'නාගකන්‍යා' දිනය සමරති. එදිනට අහිගුණ්ඨිකයන් විසින් අල්ලා ගන්නා ලද සියලු නයින් නිදහස් කර වනයට මුදාහැරේ.

බුලත් මෙලොවට ගෙන එන ලද්දේ නාග ලෝකයෙන් බව විශ්වාස කෙරේ. 'නාගවල්ලි' නම් බුලත් විශේෂයක් ද වේ. නාගයා බුලත් කොළය ගෙන එනවිට කොළය, දෙකට නවා කටේ තබාගෙන ආ බව කියති. එසේ බුලත් කොලය දෙකට නවා දෙකෙළවර මුවේ තබාගෙන එනවිට නාගයාගේ මුඛයේ විෂ, බුලත් කොළයේ දෙකෙළවර තැවරුණෙලු. එබැවින් බුලත් කන විට එහි දෙකෙලවර කැඩීම සිරිතක් කොටගෙන ඇත. (පීරිස්, 2007) මෙහි මානව විද්‍යාත්මක වැදගත්කම විමසා බැලීම වැදගත් වේ. මක්නිසාදයත් ඒ හා බැඳුණු බොහෝ ජනප්‍රවාද නමත් රාශියක් ඇති බැවිණි.

## පක්ෂීන් පිළිබඳ ජනශ්‍රැති

ජනශ්‍රැති අතර පක්ෂීන්ට හිමිවන්නේ වැදගත් තැනකි. පක්ෂීන් අතර ගෙදර කුඩුවල දමා ඇතිකරන ගිරවුන්, මයිනන්, සැළලිහිණියන් මිනිසාට ඉතා සමීපය. මෙම සතුන්ට ද විශේෂ වූ භාෂාවක් ඇත. (Leach,1947) ගෙරුණ්ඩ පක්ෂියා (උඩරට පැරණි සිතුවම් හා කැටයම් කලාවේ දක්නට ලැබෙන හිස් දෙකක් ඇති රාජාලියා වැනි මනඃකල්පිත සත්වයා) (ලියනගේ, 2001), විෂ්ණු දෙවියන්ගේ වාහනය ලෙස සැලකෙන ගුරුළා, මකරා, ගජ සිංහයා වැනි සතුන් මනඃකල්පිත සත්ව විශේෂයන්ය. සත්ව ලෝකයේ පක්ෂීන් අතර රජා ලෙස සැළකෙන්නේ රාජාලියාය. ඌ වසර හැත්තෑවක් ජීවත් වන්නේ යයි සැලකේ. රාජාලියා වටා ගෙතුනු ජනප්‍රවාද රාශියක් පවතී. රාජාලියාගේ ජීවිතය බොහෝ දෙනෙකු ආදර්ශයට ගනු ලැබේ. වයස අවුරුදු හතළිහේ දී ඉතා දුෂ්කර ශාරීරික ක්‍රියාවලියක නිරත වී ඉදිරියට තවත් වසර තිහක් ඌ ජීවත් වේ. එසේ නොවී නම් ඌට ජීවිතයෙන් සමුගන්නට සිදුවේ. ගොඩබිම වාසය කරන විශාලතම පක්ෂියා ලෙස සැලකෙන පැස්බරාට පැයට සැතපුම් හතළිහක වේගයෙන් දිවිය හැකියයි විශ්වාස කෙරේ.



අතීතයේ සිටම බොහෝ පක්ෂීන්ට කථාකල හැකියැයි විශ්වාසයේ පවතී. ගිරවා, මයිනා, සැළලිහිණියා හා කොකටු වර්ගයේ ගිරවුන්ට යම් භාෂා ගෙලියකින් වචන උච්චාරණය කළ හැකියයි විශ්වාසයේ පවතී. පුරාණ ලංකාවේ සංදේශ යැවීම සඳහා යොදා ගන්නා ලද්දේ විවිධ පක්ෂීන්ය. පරෙවියන්, කෝකිලයන්, හංසයින්, සැළලිහිණියන් හා ගිරවුන් වැනි සතුන් ඒ සඳහා යොදා ගන්නා ලදී. උඩරට නර්තන කලාවට අයත් වන්නම දහඅටෙහි ද පක්ෂීන්ට වැදගත් තැනක් ලැබාදී තිබේ. ඒ තුළ ඔවුන්ගේ ගමන් විලාසය සහ ජීවන වටපිටාව ඇතුලත් කොට තිබේ. මෙම පක්ෂීන් අතර මොණරා, උකුස්සා, සැවුලා වැදගත් තැනක් ගනියි. (දිසානායක)

ඇතැම් පක්ෂීන්ගේ හැඬ ඇසීම, උන් දැකීම අසුභ විය හැකි අතර, ඇතැම් පක්ෂීන් සුභවේ. ගේ කුරුල්ලන් නිවසට පැමිණීම, කූඩු තැනීම වාසනාවන්ත දෙයකි. පරෙවියන් ඒම ද, ඔවුන් නිවසේ හැදීමද වාසනාව ගෙන දෙන දෙයකි. නමුත් ඇටිකුකුළන්ගේ පැමිණීම අසුභ දෙයකි. (ඇටිකුකුළන් ආ දෝසේ හෙට පලයං ඒ දෝසේ) එක පොල්කිච්චෙකු දැකීම අවාසනාව ගෙන දෙන්නකි. එවිට ඌ තවත් අයෙකුට පෙන්වීම සිරිතකි. පොල්කිච්චන් දෙදෙනෙකු, තිදෙනෙකු දැකීම වාසනාව ගෙන එනු ලබන දැක්මකි. කණකොකෙක් හෝ කීපදෙනෙකු නිවසක් උඩින් කෑ ගසාගෙන යාම මරණයේ සංකේතයකි. ඇතැම් මිනිසුන්ගේ ස්වභාවයට කණකොකා බද්ධ කොට තිබේ. (කණකොක් සුද පෙනෙන්නේ ඉගිලෙන විටය) උලමා බිහිසුණු අතිභයානක සතෙකි. 'යක්කුරුල්ලා' ලෙස ගැමියෝ ඌ හඳුන්වති. උලමාගේ 'සොහොන් බෙර ගැසීම' වසංගත රෝග පැතිරීමෙත්, මරණයේත් සංකේතයකි.

ගමනක් යාමට සැරසෙන විට කුකුළෙකුගේ හැඬීම ඉතා සුභදායක දෙයක් සේ සැලකේ. කිකිළියන් හඬලන්නේ නම් එය ඉතා භයානක, අස්වාභාවික මූසල දෙයකි. බොහෝ අය එවැනි කිකිළියන් මරණයට පත් කරන බව පර්යේෂණයේ දී හෙළිවිය. ගමනක් පිටත්වෙන විට කැරලා හැඬීම ද අසුභ පෙරනිමිත්තක් සේ සැලකේ. කැරලා ගමන් මග හරහා කෑගසමින් ඉගිලෙයි නම් එය බාධාවකි. ගෙයි වහලයේ සිට හෝ ගෙයි දොරකඩ දෙස බලාගෙන හඬයි නම් එය මරණයකි. රාත්‍රි කාලයට බස්සන්ගේ කෑගැසීම ද මූසල සිදුවීමකි. එවිට

නිවැසියන් සකච්ඡයක් ලිප තුලට දමනු ලබයි. එය රත්වෙන විට ඌගේ කෑගැසීම නවතී. ලංකාවේ පමණක් ජීවත් වන බස්සන් රාශියක් වෙති. කපුටා පිළිබඳ විවිධ විශ්වාස සමාජය තුළ පවතී. කපුටෙක් හිරු උදාවට පෙර පාන්දර නිවසක් අසල සිට හැඬීම අසුභය. එය ශෝකජනක මරණයක් පිළිබඳව අසන්නට ලැබීමක් මෙන්ම නිවැසියන්ට රෝගාබාධ ඇතිවීමේ පෙරනිමිත්තක් සේ සැලකේ. ඉර මුදුන් වේලාවක කපුටාගේ කරවිකිරීම සතුටුදායක ආරංචියක් ලැබීමේ පෙරනිමිත්තකි. සවස් කාලයේ දී නම් ඥාති මිත්‍රාදීන් පැමිණෙති. කපුටාගේ හඬෙහි ඇත්තේ මොලොක් බවක් නම් එමගින් ප්‍රකාශ කරන්නේ සුභ ආරංචියකි. හඬ රළුවීම අසුභ ආරංචි ගෙන ඒමකි. කපුටා වයඹ හෝ ඊසානදිග සිට කරවි කරයි නම් මළගමක පුවතක් අසන්නට ලැබේ. කැමකන මොහොතේ ගිනිකොණ සිට හඬයි නම් බිරිඳට අපල ගෙනදෙන්නකි. කපුටා හඬන්නේ නිරිතදිග සිට නම් එය සුභ ලකුණකි. ඉරමුදුන්යාමයේ වහලයක් මත සිට හඬන්නේ නම් එය සොරකමක පෙරනිමිත්තකි. ගේ දොරකඩ සිට උදෑසනක නිවස දෙස බලා කරවි කරන්නේ නම් ඥාතියෙකු පැමිණේ. දිරූ ඉපලක හෝ මැරීගිය අත්තක මත හිඳ හඬන්නේ නම් එය ඉතාමත් අසුභ ලක්ෂණයකි. කපුටා හිසමතට හෝ උරහිස මතට පැහැරීම සතුටුදායක පෙරනිමිත්තකි. යටිපතුලට හෝ දණ හිසින් පහළ කොටසට පැහැරුවේ නම් එය මළගමක පෙරනිමිත්තකි. කාක මෛථුනය දැකීම අසුභ නිමිත්තක් සේ විශ්වාස කෙරේ. (පීරිස්, 2007) කපුටාට හඬවල් කිපයක් නිකුත් කළ හැකි අතර, කවුඩාට ද විවිධ හඬවල් රැසක් නිකුත් කළ හැකි යයි විශ්වාසයේ පවතී. කාවන්තිස්ස රජතුමා කපුටන් කථාකරන බස තේරුම්ගත් කෙනෙකු බව ජනශ්‍රැතියෙහි දැක්වේ.

විවිධ පක්ෂීන්ගේ චර්යා නිරීක්ෂණය කිරීමෙන් කාලගුණ අනාවැකි මෙන්ම වසංගත රෝග පැතිරීමේ අනාවැකි පළ කිරීමේ ක්‍රමයක් ද වේ. නිදසුන් ලෙස උකුස්සාගේ හැඬුම නියගය පිළිබඳ අනාවැකියකි. මෙරු ඉගිලීම, වැහිලිහිණියන් රංචු වශයෙන් පියාඹායාම, අහසේ සැරිසැරීම වර්ෂාව ලැබීමේ පෙරනිමිත්තකි. කැරලාගේ දීර්ඝ හැඬීම දැඩි නියං කාලයක් උදාවීමක් ලෙස සම්ප්‍රදායිකව විශ්වාස කරති. පොල්කිච්චන් රංචු ගැසී මිදුලේ ඇන කොටා ගනමින් කෑ ගසයි නම් එම නිවසේ රංඩු සරුවල් ඇතිවන බව කියති. කොහා හඬන්නේ අවුරුදු මාසයට පමණි. කෝකිල නාදය බක්මහේ අසිරිය කියාපාන්නකි. බක් මාසෙන් පසුව උගේ හැඬලීම නැසීයි යන බව විශ්වාසයේ පවතී.



## සත්ත්ව ශ්‍රැතිය කෙරෙහි බුදුදහමේ බලපෑම

මනුෂ්‍යයා කෙරෙහි පමණක් නොව ලොව වාසය කරන්නාවූ සියලු සතුන් කෙරෙහි මෛත්‍රිය කරුණාව හා අවිහිංසාව දැක්වීමට මගපෙන්වූ ලොව පහළ වූ උත්තරීතර ආගමක් දර්ශනයක් ලෙස බුදු දහම පෙන්වාදිය හැකිය. බුදු දහමින් හෙළිදරව් කෙරෙන මානව සමාජය තුළ සත්ත්ව ලෝකයට ද ඉතා වැදගත් තැනක් ලැබී තිබේ. බුද්ධ භාෂිතයෙහි දක්වන ලද දිව්‍යලෝක නය, සතර අපාය මිනිසාට ගෝචර වූවක් නොවේ. මක්නිසාදයත් ඒ සියල්ල පුහුදුන් සිහට අදෘශ්‍යමාන බැවිණි. නමුත් මනුෂ්‍යයාට තිරිසන් ලෝකය පැහැදිලිව පෙනේ. ඒ සියලු තිරිසන්ගත සතුන් අප සමග ජීවත්වන බැවිණි. නමුත් මෙම ලෝක දෙක අතර අන්තර් සම්බන්ධතා මෙන්ම ගැටුම් සහගත වූ හැළහැප්පිලි ද විද්‍යමාන වේ. ඒ නිසාම සත්ත්වලෝකය අපෙන් ඈත්වූවක් නොවේ. අද විද්වතුන්ගේ දැඩි අවධානයට පාත්‍ර වී ඇති පරිසරය පිළිබඳව කථාකිරීමේ දී මානවයා, සියලු සතුන් මෙන්ම ගස්වැල් ද අයත් වේ.

මෙහි සමබරතාවයෙහි වැදගත්ගම පිළිබඳව ඉතා ගැඹුරින් බුද්ධ දේශනාවෙහි සඳහන් වේ. සත්ත්ව ඝාතනය, සත්ත්ව හිංසාව බුදු දහමින් මුළුමනින්ම ප්‍රතික්ෂේපිතය. ගැරඬියෙකු පෙළූ ළමයින් පිරිසකට බුදුන් වහන්සේ දේශනා කරන ලද්දේ "මා මෙන් අනිත් සතුනුත් සැපයට කැමති"යයි තමා උපමාකොට සිතා කවදාවත් කිසි සතෙකුට හිංසා පීඩා කරන්න එපා. කුළුනෙහි සතුනට මෙත් වඩන්න යනුවෙනි. (සිරි ඥාණෝභාස තිස්ස හිමි, 2001) සත්ත්ව ලෝකය දෙස සානුකම්පිකව බැලීමට පුද්ගලයා යොමුවීම කෙරෙහි බලපෑ සාධක බොහොමයක් වේ. ඒ සඳහා බලපෑ ලද ප්‍රබලතම සාධකයක් වන්නේ ත්‍රිපිටකානුගත සූත්‍ර දේශනාය. ඒ අතරින් කරණීය මෙත්ත සූත්‍රයට, මෙත්තානිසංස සූත්‍රයට, කඳ පිරිතට හිමිවන්නේ අද්විතීය ස්ථානයකි. (වන්දිම හිමි, 2000) මෛත්‍රී සිත්මට පුරුදු පුහුණු වූ තැනැත්තා සියලු සත්ත්වයෝ සැපවත් සිත් ඇත්තෝ

ඇත්තේ මිනිස්මස්ය. ඌ යමෙකුගේ අතින් ඝාතනයට ලක්වූ අවස්ථාවක තම රුධිරය අතින් පිස පෙන්වන බව කියැවේ. බුද්ධ චරිතය තුළදී ද මෙම සතුන් බුදුන් වහන්සේට උදව් කළ අවස්ථා දැක්වේ. මුචලින්ද නාගරාජයා, පාරලෙයිය වනයට වැඩි කළ උපස්ථාන කළ වානරයා, ඇතා ඊට නිදසුන්ය. ඊට අමතරව බුදුන් වහන්සේ ධර්මය දේශනා කරන ලද අවස්ථාවල දී ඊට ඇහුම්කන් දුන් සතුන් මරණින් මතු සුගතිගාමී වූ කථා පුවත් බෞද්ධ සාහිත්‍යයේ දැක්වේ.

බුදුදහම තුළ අවධාරණය කෙරෙන සත්ත්ව අවිහිංසාව, සතුන්ට කරුණාව, මෛත්‍රිය දැක්වීම හේතුකොට ගෙන බෞද්ධ සමාජය තුළ සතුන් කෙරෙහි සුවිශේෂ අවධානයක් යොමුකිරීමට හේතුවී ඇතැයි සිතිය හැකිය. ඒ සඳහා රාජ්‍ය අනුග්‍රහය ද නො අඩුව ලැබී තිබෙන බව පෙනේ. නිදසූනක් ලෙස ධර්මාශෝක රාජ්‍ය සමය පෙන්වාදිය හැකිය. (ථාපර්, 2009) බුදුදහම වැළඳ ගැනීමෙන් පසු දැඩි අවිහිංසාවාදී පිළිවෙතක් අනුගමනය කළ රජු වඩාත්ම අහිංසාව දක්වා ඇත්තේ තිරිසන් සතුන් කෙරෙහිය. සතුන්ට පීඩා ගෙන දෙන කුකුළන් කෙටවීම වැනි විනෝද ක්‍රීඩා සම්පූර්ණයෙන්ම තහනම් කොට සත්ත්ව මාංශ භක්ෂණය තහනම් කළ බව රජුගේ සෙල්ලිපිවල ඇති ආඥාවලින් පැහැදිලිය.

යාග හෝම සඳහා බිලිපූජා කිරීම බොහෝ දුරට වැළැක්වූ අතර, මුව දඩයම සම්පූර්ණයෙන්ම නවතා ඇත. නිකරුණේ හෝ සතුන් මරනු පිණිස හෝ කැලෑ ගිනිතැබීම ද, පණ ඇති සතුන් ගොදුරට දී තවත් සතුන් රැකීම ද, අවුරුද්දේ සමහර දිනයන්හි මසුන් මැරීම හා විකිණීම ද තහනත් කොට නීති පනවන ලදී. එමෙන්ම මයිනා, ගිරා, සක්වාළිහිණි, පරවි ආදී කුරුල්ලන් රාශියකටම එතුමා අභය දානය කර ඇත. මුළුතැන්ගෙයි බොජුන් සපයනු සඳහා දිනපතා මොනරුන් දෙදෙනෙකු හා මුවෙකු මරණු ලැබූ බව අසා ලැජ්ජාවට පත් රජතුමා එය ද සම්පූර්ණයෙන්ම නැවැත්වූ බව කියැවේ. එතුමාගේ ධම්ම ප්‍රතිපත්තියට අනුව සෑම ගමකට පාහේ මිනිසුන් උදෙසා මෙන්ම තිරිසනුන් උදෙසා ද ගිලන්හල් කරවා මහාමාර්ග අසල ළිං තනවා මගීන්ට සෙවන දෙනු පිණිස මඟ දෙපස නුග, අඹ ආදී ගස් රෝපණය කරවූ බව ද සෙල්ලිපිවලින් හෙළි වේ.

මෙම ප්‍රතිපත්තිය අනුගමනය කරන ලද ශ්‍රී ලංකාවේ රජවරුන් ද පසුකාලෙක මාඝාත ආඥාව පනවන ලදී. මහාදැළියා රජු ඇවෑමෙන් එම රජු පුත් ආමණ්ඩගාමිණී අභය රජ රජය කරවීය. එම රජු ලක්දිව මුළුල්ලෙහි. මාඝාතය හෝ සතුන් නොමරවයි යන ව්‍යවස්ථාව කරවීය. (මහාවංශය (සංස්). 2007 බුද්ධදාස රාජ්‍ය සමයද වැදගත් අවධියකි. මෙම රජු ද සතුන් කෙරෙහි අනුකම්පා කළ අයෙකි. කුෂ්ඨ රෝගයෙන් පෙළුණු නාගයකු සැත්කමකින් එතුමා සුවපත් කළ බව මහාවංශයෙහි දැක්වේ.

මිහින්දාගමනයෙන් පසුව බදු දහමේ ආභාසය ලැබී සිංහල බෞද්ධ ජනසමාජය විශාල වෙනසකට බඳුන් වී ඇති අතර, සත්ත්ව හිංසනය සිදු විය හැකි සියලු මාර්ග අවහිරවන පරිදි ආකල්ප සංවර්ධනයක් සිදුවී ඇති බව පෙනේ. බුදුන් වහන්සේ විසින් දේශනා කරන ලද ප්‍රධාන දාන වර්ග තුනෙන් ප්‍රමුඛස්ථානය ලැබී ඇති එකක් වනුයේ අභය දානයයි. ඉහත සඳහන් කරන ලද ආකාරයට දක්ඛින විභංග සූත්‍රයේ තිරිසන් ගත සතෙකුට දෙන ආහාර වේලකින් ආත්ම සියයක් පන්සිය වතාවක් විපාක ලැබෙන බව දක්වා ඇත. සත්ත්ව ඝාතනයෙන් වැළකී සිටීමෙන් ආනිසංස විසිතුනක් ලැබෙන බව පෙන්වා දී තිබේ. තෝදෙය්‍ය සිටුපුත්‍රයා යමෙකු නිරෝගීව, දීර්ඝායුෂ විඳීමට හේතුව කුමක්දැයි විමසූ විට බුදුන් වහන්සේගේ පිළිතුර වූයේ සත්ත්ව ඝාතනයෙන් වැළකීම ඊට හේතුව බවයි. මත භක්ත ජාතකය වැනි ජාතක කථා තුළින් ද සත්ත්ව ඝාතනය හා එහි ආනිසංස පිළිබඳව දැක්වෙන අවස්ථා රාශියක් හමුවේ.

මෙම බෞද්ධ සංස්කෘතික පසුබිම නිර්මාණය වීමේ දී ඊට හින්දු ආභාසය ද ලැබී ඇති බව පෙනේ. අවිහිංසාව ගරු කරන හින්දු සංස්කෘතියට අනුව තිස්තුන් කෝටියක් වූ දෙවි දේවතාවුන් වහන්සේලාගේ වාහන උරුමකර දී ඇත්තේ පශු පක්ෂීන්ටය. එබැවින් ඒ සියලු සතුන් කෙරෙහි ගෞරව සම්ප්‍රයුක්ත බියක් දැක්වීමට, උන් ආරක්ෂාකිරීමට පෙළඹී ඇති බව පෙනේ. නිදසුන් ලෙස විශ්ණු දෙවිඳු (ගුරුළා) දුර්ගා දේවිය (ව්‍යාඝ්‍රයා) ස්කන්ධකුමාර දෙවිඳු (මොනරා) ගණ දෙවිඳු (මීයා) ඊශ්වර දෙවිඳු (ගවයා) යනාදී වශයෙනි. ලාංකේය බෞද්ධ දෙවියකු වන සමන් දෙවිඳුගේ වාහනය වන්නේ ඇතාය. සූනියම් දෙවියන්ගේ (ගම්බාර) වාහනය වන්නේ සුදු අශ්වයෙකි.



හින්දු ආභාසය ලද ජ්‍යොතිෂය අනුව ද සත්ත්ව හිංසනය පිටු දැක ඇත. ලග්න බොහොමයක සංකේතය වන්නේ සතුන්ය. නිදසුන් ලෙස මේෂ (එළුවා) වෘෂභ (ගොනා) කටක (කකුළුවා) සිංහ (සිංහයා) වෘශ්චික (ගෝනුස්සා) හා මීන (මාළුවා) යනාදී වශයෙනි. සෙනසුරුගේ වාහනය කපුටාය. සෙනසුරු අපලයට (පෙර කරන ලද අකුසල හා පාප කර්ම) බලු කපුටු දානය අනු දැන ඇත. කපුටන්ට ගිතෙල් සහිත කිරිබත්දීම අපලය සමනය වීමට හේතුවක් වේ. මාළුන්ට පොරිදීම ද බහුලව සිදුකරන්නකි. බොහෝ අපල සඳහා මරණයට කැපවූ ගවයන්, එළුවන්, කුකුළන් නිදහස් කිරීම බහුලව කරනු ලබන පුණ්‍යකර්මයකි. සිරකරන ලද කූඩුකරන ලද ගිරවුන් වී කුරුල්ලන්, ගේ කුරුල්ලන් නිදහස් කිරීම ද අපල උපද්‍රව සමනයකර ගැනීම සඳහා පින් පිණිස ඉටුකරනු ලබන චාරිත්‍ර වාරිත්‍ර බවට පත් වී තිබේ.

සත්ත්ව ශ්‍රැතිය තුළ බෞද්ධ ආභාසය මත පදනම්වූ විශ්වාස ඇදහිලි රාශියක් දෛනික ජීවිතයේ දී හමුවේ. මේ පිළිබඳව විමසීමේ දී පුද්ගල ද්වාරකර්ම අවස්ථා වැදගත් තැනක් ගනියි. මේ අතරිනුත් උපත හා සම්බන්ධ විශ්වාස විමසා බැලීම වැදගත්ය. ගැබිණි සමයේ දී කාන්තාවක විසින් කිළි ආහාර ලෙස සළකා සත්ත්ව මාංශ වලින් වැළකී ඇත. විශේෂයෙන්ම ගෙරිමස්, වැලිමුව මස්, මීමිනි මස්, කබල්ලෑමස්, ඉත්තෑ මස් වැනි සත්ත්ව මාංශ නොකෑ යුතු වේ. එමෙන්ම 'රං' ශබ්දයෙන් අවසන් වන ඌරු, මගුරු, තෝර, මෝර මාළු ආදියද කිළි සහිතයයි සැළකේ. ඌරා, මහසෝනාගේ වාහනය ලෙස ද පිළිගැනීමක් පවතී.

බෞද්ධාගමික බලපෑම හේතුකොට ගෙන ඇති වී ඇති විශ්වාස ලෙස පහත සඳහන් අවස්ථා ද මතුකොට දැක්විය හැකිය. ගැබිණි මවක් කුඹල්ගෙවල් කැඩීම, මකුළුදැල් කැඩීම, කුරුළු කොබෙයියන්ගේ කැදලි කඩා දැමීම, කුහුඹුවන් වැනි සතුන්ගේ කූඩු කැඩීම බිත්තර බිඳීම වැනි ඒවා නොකළ යුතු යයි සැළකේ. සීවලී මහරහතන් වහන්සේගේ උපත හා සම්බන්ධ කථා පුවත, හා බෝධිරාජ කුමාරයා හා සම්බන්ධ කථා පුවත ආදිය බලපා ඇතැයි සිතිය හැකිය. බෝධිරාජ කුමාරයාගේ 'වඳභාවයට' හේතුව වූයේ අතීතයේ බිත්තර අනුභව කිරීම නිසායයි සඳහන් වේ.

අතීතයේ දී 'වැදුම්ගෙය' සකස්කිරීමේ දී ද බෞද්ධ ආගමික පසුබිම පිලපා ඇතිබව පෙනේ. වැදුම්ගෙය සකස් කිරීමට පොහොය දිනයක් තෝරාගත යුතුය. එය සුදානම් කරන්නේ ගැබිණිය විසාරයට හෝ නැමට ගිය අවස්ථාවකය. ඒ සඳහා පොහොය දිනයක් තෝරා නොගත්තේ නාම්බරයේ මකුළුදැල් ආදිය කඩා පිරිසිදු කිරීමේ දී මකුළු සිත්තර, හුනු සිත්තර, කුඹල් ගෙවල් වැනිදේ කැඩී බිඳී යාහැකි නිසාය. මෙවැනි ක්‍රියා බෞද්ධ පසුබිමට අනුව ගැබිණියගේ ගැබ්සෙනෙරි අයහපත් ලෙස බලපෑමක් ඇතිකළ හැකියයි විශ්වාසයේ පවති. ගර්භණීන්ට මෙන්ම ගැබිණි සතුන්ට ද ආහාර පානදීම පුණ්‍යක්‍රියාවක් (meritorious Act) සේ සැලකේ.

සිංහල බෞද්ධ ජනයාගේ ප්‍රධාන ජීවනෝපාය වූයේ ගොවිතැනයි. එය මඩගොවිතැන හේන් ගොවිතැන හා ගෙවතු වගාව යනුවෙන් තුන් ආකාර වේ. (පෙළ මග විසිතුරු, 2003) බිරිඳ ගැබ්බර වී සිටින අවස්ථාවක ඇගේ ස්වාමියා හේන ගිනිතැබීමේ කටයුත්තට සහභාගි නොවිය යුතු වේ. හේන් ගිනිතබන විට කැපූ හේනේ ඉපල්යට පසුරණ සතුන් ලැග සිටිය හැකිය. එවිට හේන් ගිනි තබන්න වුන්ගේ අත් වැරැද්දෙන් එකී සතුන් දැවී යා හැකිය. එබැවින් එවැනි අත්වැරැද්දක් වෙතොත් එයට සමාව අයදිමින් දෙවියන්ට කන්නලව් කරති. ගින්නෙන් දැවී විළිස්සීමෙන් සතුන් මගහරවන ලෙසට බැගෑපත් වෙති. කැපූ හේනේ සතුන්, සිව්පාවුන් සිටිත් නම් ඔවුන් එළවා දැම්ම සඳහා ශබ්ද නගා 'ගිනියාතිකා' කියති. එකී යාතිකාව කියවන විට වියැලී ගිය අතු ඉපල් අතරේ සැඟවී සිටින සතුන් ඉන් පිටත් වී නොකැපූ ගස් ඇති මහ කැලෑවට පලා යන බවට විශ්වාස කෙරේ.

"උඩින් පියාඹන සත්තු, කුරගානා සත්තු
බිඩගාන සත්තු, පොළොව පස්යට සත්තු, අළු නොවී පලයල්ලා
. . . . (පීරිස්, 2007)

ගිනි යාතිකාවෙන් පසු සියලු දෙනාම එක් වී ශබ්ද නගා 'හූ' කියති. මහ හඬින් ඝෝෂා කරති. හූ හඬින් කලබල වන සතුන් පලා යන බැවින් උන්ගේ ජීවිත ගිනිදැල්වලින් බේරෙයි. සතුන්කෙරේ පැවතුනා වූ ආදරයත්, කරුණාවත් හේතුකොට ගෙන තිරිසන් සතෙකුගෙන් වුව ද පමණ ඉක්මවා වැඩ නොගැනීමේ සිරිත මෙරට



සංස්කෘතිය තුළ කැපී පෙනෙන ලක්ෂණයක් විය. කොතෙක් ප්‍රමාණයක් හාන්නට ඉතිරිව තිබුණත් දවසපුරා හරකුන්ගෙන් වැඩගන්නා සිරිතක් නැත. වරුවක් වැඩ කළ පසු ගවයන් බැම්මෙහි මුදාහැර නිදැල්ලේ යන්නට ඉඩ සළසනු ලැබේ. සතුන්ගෙන් පමණ ඉක්මවා වැඩගැනීමත්, උන්ට නිසිලෙස ආහාර ලබා නොදීම සහ සාත්තු සප්පායම නොකිරීම, උන්ට හිරිහැර කිරීම බර පතල පාපකර්මයක් ලෙස සළකන ලද අතර එවැනි පවක ප්‍රතිඵලය වන්නේ මතු භවයක දී තමන් තිරිසන් සතෙකුව ඉපිද එකී ණය ඒ සතා වෙනුවෙන් ගෙවන්නට සිදුවීමයි. හරකුන් යොදාකරන සෑමෙදී ඇසෙන අඬහැරය ගවයාත්, මිනිසාත් අතර තිබූ සුහද බැඳීම සංකේතවත් කෙරේ. අඩහැරයේ දී ගවයාට තිසරණ සරණ, දෙවිරැකවරණ ප්‍රාර්ථනා කරනු ලැබේ.

තිරණ සරණයි - බුදුන් දැකපන් මගෙ පුරතල් මීමෝ උඹ
සතර වරං දෙවියන්ට බාරයි - මගෙ මී වස්සා උඹ
බුදුන් දැක නිවන් දැකපන් මගෙ එළවස්සා උඹ
තිසරණ සරණයි උඹලට මගෙ වහුදරුවෝ උඹ උවෝ, උවෝ, උවෝ, උවෝ යනාදි වශයෙනි. (පීරිස්, 2007)

ශුද්ධ භූමියක් වූ කමතෙහි සතුන් මැරීම, මස්කිරීම වැනි කටයුතු කිරීම බරපතල වරදක් සේ සලකණු ලැබීය. කුඹුරුවල කුරුල්ලන් සඳහා වෙන්කෙරෙන 'කුරුළුපාලුව' ද පුණ්‍ය කර්මයක් සේ සැළකේ. කුඹුර වපුරන විට කුරුල්ලන් වෙනුවෙන් කුඩා කොටසක් වෙන් කරන ලදී. එය ද පොහොර, ජලය යොදා සශ්‍රික කරන අතර, කුඹුරෙහි ගොයම් කැපුව ද එම කොටස ඉතිරි කරනු ලැබේ. අනෙක් කොටස් වල වී කැමේ දී සතුන් පලවා හැරියද මෙම කොටස උන්ගේ පරිහරණය සඳහා වෙන්කෙරේ ගෙවත්තේ පලතුරු එලදාව ද අතින්, කෙක්කෙන් නෙලාගත් පසු සෙස්ස සතුන් සඳහා ඉතිරි කරන සම්ප්‍රදායක් ජන සමාජයේ පවති. ඒ සතුන්ගේ කුසගින්න නිවීම මහත්ම පුණ්‍යකර්මයක් වූ නිසාවෙනි.

## නිගමනය

ඉහත කරුණු කාරණා විමසා බැලීමේ දී සත්ත්ව ශුෘතියට ලැබෙන්නේ ඉතා වැදගත් තැනක් බව පැහැදිලි කරුණකි. මානව

විද්‍යාත්මක අධ්‍යයනවල දී උක්ත මාතෘකාව සම්බන්ධයෙන් ලෝකයේ විවිධ ප්‍රදේශ වලින් කරුණු ඒකරාශී කොට තිබේ. අතීතයේ සිට පැවතියාවූ එම සත්ත්වශ්‍රැතින් වර්තමානයේ පවා හඳුනාගත හැකිය. ඒ සඳහා බොහෝ ජනප්‍රවාද (myth) හේතු භූත වී ඇත. ජනකථාවල දී ජනකවියේ දී විවිධ විශ්වාස ඇදහිලිවල දී එසේම ඇතැම් සමාජ අවස්ථා නිරූපනයවීමට සහ පුද්ගලයාගේ ගතිපැවතුම් විග්‍රහකිරීමට උපමාවශයෙන් ද ඉතා බහුල ලෙස ලෝකය සත්ත්වශ්‍රැති ප්‍රයෝජනයට ගෙන ඇත. ලංකාවේ ද අතීතයේ සිටම භාවිතයට ගැනුණු. විශ්වාස කරන ලද, පුද්ගල සමාජානුයෝජන ක්‍රියාවලියේ දි දායක විය හැකි, පෞරුෂ සංවර්ධනයට දායක විය හැකි සත්ත්වශ්‍රැති රාශියක් ව්‍යවහාරයේ පවති.

පෙරදිග සමාජයේ මෙම සත්ත්වශ්‍රැති නිර්මාණයවීමේ දී ආගමික ආභාසය බෙහෙවින් ලැබී ඇති බව පෙනේ. එය ජන ජීවිතයේ බොහෝ තැන්වලින් විද්‍යාමාන වේ. මෙම ක්‍රියාවලිය බහුලව සිදුවී ඇත්තේ හින්දු ආගමෙන් හා බුදු දහමෙන්ය. ජන ආගමෙන් ද ඊට විශාලඅනුබලයක් ලැබී තිබේ. මෙම ආගමික විශ්වාසයක් අවිහිංසාව මත පදනම් වී තිබේ. ඉන්දියාවේ ප්‍රචලිත පංචතන්ත්‍රය ගත්ත ද සත්ත්වශ්‍රැති විශාල වශයෙන් උපහාසයට, අපහාසයට, දැනුමට, ප්‍රඥාවට, බුද්ධියට ඉවහල්වන පරිදි යොදාගෙන තිබේ. හින්දු ආගමෙන් නිරූපණයවන බහුදේවවාදය (Polythesm) සත්ත්ව ලෝකය හා බෙහෙවින් බද්ධ වී ඇත. ජ්‍යොතිෂය ශාස්ත්‍රය තුළ ද සත්ත්ව ලෝකය නිරූපනය වන අවස්ථා දෘෂ්‍යමාන වේ. සර්පයින් දෂ්ට කිරීමට, සතුන්ගෙන් හානි සිදුවීමට, බල්ලන් සපා කෑමට පුද්ගලයාගේ ග්‍රහ බලය කේන්ද්‍රගත වේ යයි විශ්වාස කෙරේ. සංකේත භාවිතයේ දී ද සතුන් බහුලව යොදාගෙන ඇත. පන්සල්වල බලු කපුටු රූප ඇඳ තැබුවේ සාංඝික දේපල අයතු ලෙස පරිහරණය කරන්නන් බලු, කපුටන් වී ඉපදෙන බව කියාපෑමටය.

ශ්‍රී ලංකාවේ උඩරට නැටුම් කලාවේ වන්නම් දහඅට පෝෂණය වී ඇත්තේද සතුන්ගෙනි. පශු පක්ෂීන් විශාල ප්‍රමාණයක් ඊට අයත් වේ. මෙයද වක්‍රාකාරයෙන් සතුන් කෙරෙහි ආදරය, කරුණාව, ගෞරවය දැක්වීමට හේතු භූත වී තිබේ. බෝධි සත්ත ආත්මභාව කෙරෙහිද සතුන් නිරූපණය වන අවස්ථාවලදී ඒ සතාගේ සමාජීය



වටිනාකම හුවා දක්වා ඇත. බෝධිසත්ත්ව ආත්ම භාවයක් ලැබූ කකුළුවාගේ 'කබොල්ල' මත සමාධිගත බුද්ධ රූපයත් රූපයක් දෘෂ්‍යමාන වන බව විශ්වාසයේ පවතී. වඳුරාගේ ශරීරය මිනිස් මස් වලින් නිර්මාණය වුවත් සේ සැළැකේ. තලගොයා ආනන්ද හිමියන් තලගොයි ආත්මයන් ලැබ බෝසතුන්ට උපකාර කළ බව ජාතක පොතෙහි සඳහන් වේ.

බුදු දහමට අනුව හඳේ හාවාගේ රූපය ආ හැටි සස ජාතකයෙන් විස්තර කෙරේ. ලේනාගේ ඉරිතුන ඇඳුනේ දෙවියන් ආදාරයෙන් උගේ පිට පිරිමැද්ද නිසාය. කුඹුරෙන් වී කපාගෙන ගොස් මහලු දෙමාපියන් පෝෂණය කළ ගිරා පෝතකයෙකු ගැන කියැවේ. සිවුරු හොරාට උගේ ස්වරූපය ලැබුණේ ගිය ආත්මයේ සිවුරු හොරකම් කිරීමේ පාපයෙනි. අවිච්චියා අදත් කෑ ගසමින් යන්නේ මෛත්‍රී බුදුන් හමුවේ තම නඩුව කියා පෑමටය. 'රෙදි හොරා නම් පක්ෂියා ද විඳින්නේ කර්මයක ප්‍රතිඵලයකි. ඌ පෙර ආත්ම භාවයක රෙදි හොරකම් කළ අයෙකි. උකුස්සා වතුර නොදුන් අයෙකි. එනිසා ඌ අද පිපාසයෙන් පෙළෙයි. ඌට වතුර නොලැබෙන්නේ පෙර ආත්මයක කළ පාපයක් නිසාය. (රත්නපාල, 1995) මානයෙන් අභිමානයෙන් යුක්ත වුවන් වඳුරන් කුකුළන් වී ආත්මභාව ලබයි. අනුන් හෙළා තලා කටයුතු කළ අය නීච සතුන්ගේ ආත්මභාව ලබයි. බෙලි කැපී මියයන්නේ පෙර සසර අනුන්ගේ බෙලිකපා මරාදැමූ අයයි. (පෙර අඟනක් එක් එළු දෙනක හිස සිඳා - ඇය ඇඟ ලෝම ගනණේ හිස් කැපුම් ලදා) ගෙරියන් පෙළක් නිරීක්ෂණය කළ බුදු රදහු වදාළේ ඒ අතර සක්විති රජුන්ද සිටින බවයි. ඊරියක ව ඉපදුනේ ආඩම්බර, අහංකාර සිටුකුමාරිකාවකි. පෙර හොරට වෙළහෙළඳාම් කළ අය මේ ආත්මභාවයේදී මාළුන්, සතුන් වී තම ශරීර මාංසය විකිණීමට ලක් වෙන බව මතයයි.

මේ නයින් බලන කල පෙනීයන වැදගත් කරුණක් වන්නේ සත්ත්ව ලෝකය දෙස පුද්ගලයා බැලූ දෘෂ්ටිකෝණයයි. අවිහිංසාව පදනම කරගත් මෛත්‍රිය, කරුණාව, දයාව පෙරදැරි කරගත් බුදු දහමේ ආභාසය ඊට බෙහෙවින් බලපා ඇත. පරිසරයේම කොටසක් වූ මෙම මහපොළව මත උපත් සෑමට ඇත්තේ සම අයිතියක් බව බුදු දහම තහවුරු කොට ඇත. නමුත් අද සත්ත්ව ලෝකයට සෑහ

සාධාරණයක් ඉටුවනවාදැයි විමසා බැලිය යුත්තකි. මෙරට දිනකට ඝාතනය වන සතුන්ගේ ප්‍රමාණය අති විශාලය. මරා දමන මාළුන්ගේ ප්‍රමාණය කිව නොහැකිය. අනෙකුත් සතුන්ද විශාල ප්‍රමාණයක් ඝාතනය කෙරේ. ඊටමෙන්ම මිරිදිය මත්ස්‍ය ව්‍යාපාරය කිරීමට අනුබල දේ. හාවාගෙන් ලේක් ගෙඩි සාදා උපන්දිනය දා කුඩා දරුවන් ලවා ඒ ශරීර කොටස් කපා කාමට දේ. තොවිල් පවිල්වල දී කුකුළෙකු මැරීමට අනුමැති වූ ලාංකිකයා ඌගේ ලේ පමණක් කරමලය විදගත් බව අප අමතක නොකළ යුතුය. අද ගර්භනී එළදෙනුන් පමණක් නොව කුඹගොනුන් පැටවුන් ද මස් පිණිස විකුණති. රුපියල් දෙකක් වැනි මුදලකට කුකුළෙකුගේ ගෙල කපති. මිනිසුන්ගේ ජීවත්වීමේ අයිතිය තහවුරු කරගැනීමට සටන් වදිද්දී සතුන්ගේ ජීවත්වීමේ අයිතිය මුළුමනින්ම පාගේ විනාශ කර ඇත. සංවර්ධනය මුවාවෙන් කෙරෙන කටයුතුවල දී ස්වාභාවික කැලෑ විනාශ වීම නිසා සතුන් වඳවී යාමේ තර්ජනයකට මුහුණ දී ඇත. අලි ගහණය සීඝ්‍රයෙන් වඳවී යති. ඇතැම් රෝගාබාධ වැළදීමේ හේතුව සතුන් යයි සලකා අද ලක්ෂ සංඛ්‍යාත සතුන් ප්‍රමාණයක් මරණයට පත් කරති.

එබැවින් ජනශ්‍රැතියේ ප්‍රධාන අංගයක් වූ සත්ත්වශ්‍රැතියෙහි වටිනාකම අද ඉස්මතුවී තිබේ. පුද්ගලයාගේ සමාජානුයෝජනය හා පෞරුෂ සංවර්ධනය කෙරෙහි ඉමහත් බලපෑමක් බුදු දහමේ ආභාසය ලත් සත්ත්වශ්‍රැතිය මගින් ඉටුවී තිබේ. සාමාන්‍ය ජනව්‍යවහාරයේ දී ද අවධාරණය කළේ පූර්ණ මිනිසෙකු වීමට නම් ඌරු කට්ටි, බූරු පිටයි, මොනර ඇහැයි බළල් කණයි තිබිය යුතු බවයි. එබැවින් සත්ත්වශ්‍රැති පිළිබඳ වඩාත් ගැඹුරු ලෙසත්, ඵලදායි ලෙසත් මානව විද්‍යාත්මක ගවේෂණ හා පර්යේෂණ සිදුකිරීම කාලෝචිත වූවක් සේ සැලකිය හැකිය.

# සිංහල සමාජය කෙරෙහි බුදු දහමේ බලපෑම

**එස්.බී.එච්. ප්‍රභාද් ඉන්දික පෙරේරා**
අධ්‍යාපන අමාත්‍යාංශය

ආගම සංස්කෘතියේ ආරම්භයේ සිටම මානව ක්‍රියාකාරකම් සමග බැඳී පැවති මූලිකාංගයකි. ආගම පිළිබඳ හැඟීම පාදක කොටගෙන සෑම සංස්කෘතියකටම අයත් ජනතාව යම් යම් විශ්වාස ගොඩනගා සිටිනවාක් මෙන්ම ඒ ඔස්සේ විවිධාකාර ක්‍රියාකාරකම් වලද නියැලී සිටිති. මෙම විශ්වාස ඇදහිලි ආදී සියල්ලම පොදුවේ විභාග කරන විට ආගම පුළුල් සමාජ සම්මුතියක් ලෙස සැළකීමට හැකිය. සමාජ විද්‍යාඥයන්ට අනුව ආගම සමාජ සංස්ථාවකි. ආගමේ ප්‍රභවය පිළිබඳ මූලික සිද්ධාන්තය ඉදිරිපත් කරන ලද්දේ ඊ.බී. ටයිලර් (E.B. TYLOR) නම් මානව විද්‍යාඥයා විසිනි. ඔහු ආගම නිර්වචනය කළේ භෞතික වස්තූන් පිළිබඳ විශ්වාසයක් ලෙසිනි.

38-CM 12876